# 8 ශ්‍රේණිය සිංහල

11 ඒකකය

# සිරි ලංකා රට ම අපි



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

පසුගිය සතියේ online පංතිය සඳහා සහභාගී වීමට නොහැකි වුනු සිසුන් සඳහා සහභාගී වූ සිසුන්ගේ උපකරයෙන් ලබා දුන් උපකාරක සටහනකි.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 11 සිරි ලංකා රට ම අපි



මහගම සේකර

## 11. සිරි ලංකා රටම අපි

### හැඳින්වීම

තමන් උපන් දේශය පිළිබඳ ඇල්මක් ඇති ඕනෑම පුද්ගලයකුගේ හදවත දේශාභිමානය, දේශහිතෛෂීභාවය හා දේශවාත්සල්‍යය බඳු හැඟීම්වලින් පිරිපුර්ණය. 'වැව. වසිනා අහස අපි' මහගම සේකර විසින් රචිත දේශාභිමානී ගී පද මාලාවකි. පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව ප්‍රමුඛ පිරිසගේ ගායනයෙන් මේ ගීය පිරිපුර්ණ වී ඇත.

### අවබෝධය

1. මේ ගීයේ පළමු වන කොටසට අනුව රටේ ප්‍රධාන කොටස් තුන මොනවා ද?
2. ගීයේ කියැවෙන ජල මූලාශ්‍රය 5ක් නම් කරන්න.
3. රටේ මාවත ගොඩ නැගෙන්නේ කා අතින් ද?
4. රට වෙනුවෙන් ගත සිත වෙහෙසන ජනයාගේ ගත දුහුවිලි, දහදිය, මඩ කවියා උපමා කර දක්වන්නේ මොනවාට ද?
5. රටක් ගොඩ නැගීමට එහි වෙසෙන ජනයාගේ ශ්‍රම දායකත්වයේ වැදගත්කම කීමට කවියා භාවිත කර ඇති යෙදුම කුමක් ද?

## අවබෝධය

1 අහස
මුහුද
පොළොව

2 මුහුද
ගඟ
ඇළ
දොළ
උල්පත්

3 ගොවියෝ සහ කම්කරුවෝ

4 රන් ආභරණවලට සහ සුවඳ විලවුන් වලට

5 බලවූ යොමා නෙත රටේ ම ආවන
අපේ අතින් ගොඩ නැගෙන / හැටි

## විශේෂණ පද

*නාම පදයක් විස්තර කරන පද නාම විශේෂණ ලෙසත් ක්‍රියා පදයක් විස්තර කරන පද ක්‍රියා පද ලෙසත් හඳුන්වයි

උදා: කඩිසර ළමයා වේගයෙන් ලියයි.

| කඩිසර | ළමයා | වේගයෙන් | ලියයි |
|---|---|---|---|
| නාම විශේෂණය (විශේෂණ පදය) | නාම පදය (විශේෂ්‍ය පදය) | ක්‍රියා විශේෂණය | ක්‍රියා පදය |

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් ඡේදයෙහි ඇතුළත් වන නාම විශේෂණ පද උපුටා දක්වන්න.

කඳු හෙලින් ද රූරා බසින දිය දහරින් ද විශාල වනයෙන් ද තොර වූ සමබිමක් වුව ද අපේ ගම් පෙදෙසෙහි අප සිත් ගත් සුන්දර ප්‍රදේශ හිඟ නො වීය. කුඩා කැලෑ රොදින් ද එළිමහනෙහි වූ සුදු වැලිතලාවෙන් ද ගැවසීගත් බිම් පෙදෙස අප සිත් ගත් තැන්වලින් එකක් පමණි. නදී තීරය ද ඒ අසල වූ කැලෑ රොදින් වැසුණු බිම් පෙදෙස ද වෙරළ ද කවීන්ගේ සිත් ගන්නා කඳු හෙල් වන ළැහැබ් වලාකුළු යන ආදි සුන්දර වස්තූන් මෙන් අපගේ සිත් ගත්තේ ය.

(අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ)

| නාම විශේෂණ පද | විශේෂ්‍යය |
|---|---|
| | |

(1)

| විශේෂණ පදය | විශේෂ්‍යය |
|---|---|
| විශාල ✓ | වනයෙන් ✓ |
| සම ✓ | බිමක් ✓ |
| සුන්දර ✓ | ප්‍රදේශ ✓ |
| කුඩා ✓ | කැලෑ රොදින් ✓ |
| සුදු ✓ | වැලිතලාවෙන් ✓ |
| සුන්දර ✓ | වස්තූන් ✓ |

2. පහත සඳහන් නාමපදවලට සුදුසු විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

i. කරත්තය　　　　ii. පාර
iii. මගියා　　　　iv. අශ්වයා
v. වෙළෙන්දා

(2) (i) රජතුමාගේ අලංකාර කරත්තය කාගෙත් සිත් ගත්තේය.

(ii) අපි අඩි පාර දිගේ ඉදිරියට ගියෙමු.

(iii) බස් රථයේ සිටි මහලු ~~මිනී~~ මගියා කිසිවක් ආහාරයට ගනිමින් සිටියේය.

(iv) තරඟයට සහභාගී වී සිටි සුදු අශ්වයා පෙරමුණ ගැනීමට සමත් වූයේය.

(v) නපුරු වෙළෙන්දා කුඩා ළමයාට බොත්තම-ක් මිලදී ගන්නට බල කරයි.

3. පහත සඳහන් ඡේදයෙහි දැක්වෙන ක්‍රියා විශේෂණ පද තෝරන්න.

රියෙහි නැගුණු මගියෙක් ගවයා වේගයෙන් දුවවන්නට වෑයම් කොට නො හැකි වූ ඇතැම් විටෙක උපාලිස්ට බැණ වදියි. උපාලිස් සිනා සෙමින් පාත් වී හඳයාගේ කොන්දට අත ගසා, අනිත් අතින් ගත් කෝටුව උගේ දෙකකුල් අතරින් යවා 'හා පුතා යං' යි කියයි. ගමන ඉක්මන් කරවනු පිණිස කෝපයෙන් කතා කරන මගියාගේ බස තේරුම් ගත්තාක් මෙන් හඳයා ද වේගයෙන් දුවයි.

(මහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ)

③ වේගයෙන්, ඉක්මනින්, කෝපයෙන්, වේගයෙන්

4. පහත දැක්වෙන ක්‍රියාපදවලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

i. බලයි
ii. ගියේ ය
iii. පතිත විය
iv. සෙලවිණි
v. ගයති

④ (i) ඇය රාජකුමාරයා දෙස අහිංසකව බලයි.

(ii) ඔහු වැස්සට පෙර ඉක්මනින් ගියේය.

(iii) වියළුණු කොළය [illegible] බිමට සෙමින් පතිත විය.

(iv) මද සුළඟට ගස්වල අතු තාලයකට සෙලවිණි.

(v) සංගීත ගාන්ධර්වයා ගීතය මිහිරිව ගයති.



## 11 සිරි ලංකා රට ම අපි

01 සිරි ලංකා රටම අපේ යනුවෙන් රචකයා දක්වන ස්ථාන තුන මොනවා ද?

..........................................................................................................

02 අපේ පැතුම් අහසට විහිදී යන්නේ කෙසේ ද?

..........................................................................................................

03 රතු කට මතු වන්නට අපට අත දෙන තුරු බලා සිටින්නේ කව් ද?

..........................................................................................................

04 රට රකිනා කොටස් දෙක කව් ද?

..........................................................................................................

05 දූවිලි සහ මඩ උපමා කර ඇත්තේ මොනවාට ද?

..........................................................................................................

06 ඔබට රට ගැන අභිමානයක් ඇති වන්නේ කුමන ගී පදයෙන් ද?

..........................................................................................................

07 ගීතයේ ඔබ කැමතිම කොටස කුමක් ද?

..........................................................................................................

### ක්‍රියාකාරකම 01

**පහත ඡේදයේ සඳහන් නාම විශේෂණ පද තෝරා ලියන්න.**

සෙල්ලම් පිටියක සාදන ලද මඩුවක් සේ කැලෑ රොද අපට බෙහෙවින් ප්‍රයෝජන විය. වහින විට අප, අපගේ හිස් සෙවණ කර ගැනීමට දුවන්නේ මේ කැලෑ රොද තුළට ය. මැස්සක් මෙන් සැදුණු පඳුරු මුදුන් නිසා, කැලෑ රොද ඇතුළත බිම වහල් තලයකින් සෙවණ වුණු මඩුවක් වැන්න. ඝනව වැඩුණු අතු ඉති සහිත පඳුරු මුදුන් කිහිපයකින් සෙවණ වුණු ඇතැම් තැනක්, මහ වැස්සක දී වුව ද අප ආරක්ෂා කරයි. සෙනසුරාදාත්, ඉරිදාත් අප උදේ සිට සවස් වන තෙක් සෙල්ලම් කරන්නේ මේ කැලෑ රොද ඉදිරියෙහි වන වැලි තලාවෙහි ය.

(මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ)

| නාම විශේෂණ පද | විශේෂ්‍යය |
|---|---|
| | |

### ක්‍රියාකාරකම 02

**පහත සඳහන් ක්‍රියා විශේෂණ පද සුදුසු ලෙස යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**
**ප්‍රවේශමෙන්, පැහැදිලි ලෙස, ශීඝ්‍රයෙන්, වහ වහා, අනලස් ව, විශ්වාසයෙන්**

i. ගංවතුර උවදුර ............................................ පහවිය.
ii. ඔහු ....................................... රිය පැදවී ය.
iii. ශිෂ්‍යයා පිළිතුර ....................................... ඉදිරිපත් කළේ ය.
iv. ඔවුහු අනතුරට ලක්වූවන් ............................................ රෝහලට ගෙන ගියහ.
v. කම්කරුවෝ ............................................ තම කටයුතු ඉටු කරති.

## ක්‍රියාකාරකම 03

1. පහත යෙදුම්වල ඇතුළත් නාම විශේෂණ පද උපුටා දක්වන්න.

    i. සිනා හඬ -
    ii. ලෙදව් බොජුන් -
    iii. නිදි පැදුර -
    iv. ඇත දියඹ -
    v. යොවුන් විය -

2. ඉහත 1 ප්‍රශ්නයේ දක්වූ නාම පදවලට වෙනත් විශේෂණ පදය බැගින් යොදා නැවත ලියන්න.

    උදාහරණ: නිල් පැහැය
    රතු පැහැය

3. පහත වාක්‍යවල ඇතුළත් ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.

    i. දරුවා බියෙන් අඬයි.
    ii. සුළඟ වේගයෙන් හමයි.
    iii. ඔහු පරෙස්සමෙන් රිය පදවයි.
    iv. ළමයා සතුටින් සෙල්ලම් කරයි.
    v. ඇය හොඳින් ඉගෙන ගනියි.

4. ඉහත ක්‍රියාකාරකමෙන් උපුටා ගත් ක්‍රියා විශේෂණ පද භාවිත කරමින් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

5. පහත දැක්වෙන නාම හා ක්‍රියා පදවලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩ නගන්න.

    i. ධාවකයා - දුවයි
    ii. සිසුවා - සමත් වෙයි
    iii. නිවේදිකාව - ප්‍රකාශ කරයි
    iv. ගස - සෙලවෙයි
    v. නැට්ටුවා - නටයි

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය